යාපනය මහා නගර සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

යාපනය මහා නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට යාපනය මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	වැඩ අවසන් නොවූ ඉදිකිරීම් 23කට අදාලවූ හා භාණ්ඩ ලබානොගත් මිලදීගැනීම් 09කට අදාල එකතුව රු.126,309,329ක ඇස්තමේන්තුගත පිරිවැය ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි.	මිලදී ගැනීම්වලට අදාල භාණ්ඩ ලැබී ගෙවීම් සිදුකර තිබූ බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ ලබාගෙන තිබූ රු.36,181,046 ක මූලධන ප්‍රදාන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	ඉදිරියේදී ආදායම් හා වියදම් ගිණුමේ ඇතුළත් කරනු ලබන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කර මූල්‍ය ප්‍රකාශන නිසි පරිදි සකස් කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂවල ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ හා සභාවේ අරමුදල්වලින් ඉටුකර තිබූ පිරිවැය එකතුව රු.114,432,350 ක් වූ මූලධන කාර්යයන් 14ක් ප්‍රාග්ධනීත කර නොතිබුණි.	2025 වර්ෂයේ ගිණුම්ගත කිරීමට නියමිත බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂ වෙනුවෙන් අයකර තිබූ හිඟහිටි ආදායම් වර්ග 04ක එකතුව රු.12,966,776ක් මූල්‍ය ප්‍රකාශනවල නිසි ගැලපීම් නොකිරීමෙන් වර්ෂයට අදාල ආදායම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	මෙම වර්ෂයේ සමුච්චිත අරමුදලට හිඟහිටි අයකිරීම් ගැලපීම් කරනු ලබන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කර මූල්‍ය ප්‍රකාශන නිසි පරිදි සකස් කළ යුතුය.

(ඉ)	සමාලෝචිත වර්ෂය තුළ මිලදීගත් වර්ග 11ක කාර්යාල උපකරණ හා විදුලි මෝටර් 03ක එකතුව රු. 9,563,863 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	මෙම වර්ෂයේ ජ'නල් සටහන් මගින් ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කර මූල්‍ය ප්‍රකාශන නිසි පරිදි සකස් කළ යුතුය.
(ඊ)	මහා නගර සභාව සතු ඉඩම් 45ක වටිනාකම, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත්, තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	හිමිකම් ඔප්පු ලබාගැනීමට කටයුතු කරමින් පවතින බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(උ)	පරිත්‍යාග ලෙස ලැබී තිබූ පුස්තකාල පොත් 7,341ක වටිනාකම් සහ එකතුව රු.1,868,567 කට මිලදී ගත් පුස්තකාල පොත් 3,057ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.	සියළුම පුස්තකාල පොත් වටිනාකම ප්‍රාග්ධනිත කිරීමට පියවර ගනු ලබන බව.	-එම-
(ඌ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවැති රු. 1,573,660ක් වටිනා ඉන්ධන, ලිහිසි තෙල් සහ කාබනික පොහොර ආදිය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	මෙම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරනු ලබන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කර මූල්‍ය ප්‍රකාශන නිසි පරිදි සකස් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	**අනුකූල නොවීම**	**සභාවේ අදහස් දැක්වීම**	**නිදෙර්ශය**
(අ)	1983 අංක 24 දරන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ 3(1) වගන්තිය	සේවකයින් 05කගෙන් අයකළ එකතුව රු.115,452ක දායක මුදල් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට යවා නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	පනතේ විධිවිධාන ප්‍රකාරව, කටයුතු කළ යුතුය.
(ආ)	2018 අංක 25 දරන (පනත මගින් සංශෝධිත) එකතු කළ අගය මත බදු අනුමත ඉඩදීම් C (XXXVII)	කසල බැහැර කිරීමේ මෙහෙයුම් සඳහා භාවිතා කරන උපකරණ සඳහා අගය එකතු කළ බදු අනුමත ඉඩදීම් වටිනාකමට අමතරව රු.1,309,938ක් අයකර සමුච්චිත අරමුදලට මාරුකර තිබුණි.	සමුච්චිත අරමුදලට මාරුකර තිබූ බව.	-එම-

(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 571(1), (2) හා (3)	වර්ෂ 02ක් ඉක්මවූ එකතුව රු.3,012,529 ක කල් ඉකුත් වූ තැන්පතු 15ක් නියාදනය කර නොතිබුණි.	ආදායම් ගිණුමට මාරුකිරීමට කටයුතු කරනු ලබන බව.	මුදල් රෙගුලාසිය අනුව කටයුතු කළ යුතුය.
(ඈ)	නාගරික සංවර්ධන අධිකාරියේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්තික සමාජවාදී ජනරජයේ 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ I කොටසෙහි 11 වගන්තිය	අනුකූලතා සහතික ලබානොගත් ගොඩනැගිලි 89ක් සඳහා කාලය දීර්ඝ කිරීමේ ගාස්තු රු.3,785,000 ක් අය කිරීමට පියවර ගෙන නොතිබුණි.	ඉදිරියේදී ගාස්තු අය කිරීමට පියවර ගනු ලබන බව.	පනතේ විධිවිධාන ප්‍රකාරව, කාලය දීර්ඝ කිරීමේ ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 351,490,036 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 418,843,362 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
වරිපනම් හා බදු	101,670,627	255,900,379	116,360,694	139,539,685	98,573,826	68,896,902	87,000,775	145,644,642
කුලී	203,490,442	199,436,001	174,845,795	24,590,206	183,340,128	100,899,682	103,765,019	18,811,356
බලපත්‍ර ගාස්තු	31,782,000	41,795,925	41,650,925	145,000	28,398,000	22,870,236	23,083,236	185,000
වෙනත් ආදායම්	384,298,500	415,929,114	391,610,487	24,318,627	378,925,622	295,789,760	298,451,832	8,715,753
	721,241,569	913,061,419	724,467,901	188,593,518	689,237,57(	488,456,580	512,300,862	173,356,751

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ **නිරීක්ෂණ පහත දැක්වේ.**

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
(අ) වරිපනම් හා බදු		
(i) සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟහිටි වරිපනම් හා බදු ශේෂය රු. 139,539,685 ක් වූ අතර ඉන් වරිපනම් දේපළ 15,280 කින් රු. 57,320,525 ක් වර්ෂ 01 සිට වර්ෂ 05ක් අතර කාලපරාසයකට අයත් ශේෂයක්ද, වර්ෂ 10ට වැඩි රු. 82,219,160 ක ශේෂයක්ද පැවැතුණි.	ඉදිරි කාලවල හිඟමුදල් කපාහැරීමට කටයුතු කරනු ලබන බව.	හිඟහිටි ආදායම් කඩිනමින් අයකර ගැනීම සඳහා පියවර ගත යුතුය.
(ii) සමාලෝචිත වර්ෂයේ මහා නගර සභාව විසින් දේපළ බදු අයකළ යුතු දේපළ 38,371කින් දේපළ 14,141ක් සඳහා K ආකෘති පත්‍ර බෙදාහැර නොතිබුණි.	K ආකෘති පත්‍ර බෙදාහැරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	K ආකෘති පත්‍ර බෙදාහැරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ) කුලී සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට කඩකුලී රු. 11,468,693 ක් සහ වෙළෙඳ පොල බදුකුලී රු. 13,121,513 ක් හිඟහිටිව පැවැතුණි. ඉන් කඩකුලී රු.3,938,000 ක් සහ බදුකුලී රු.7,610,758 ක් වර්ෂ 05කට අධික කාලයක සිට පැවැතුණි.	ඉදිරි කාලයේ අයකිරිමට ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	-එම-
(ඇ) වෙනත් ආදායම් ලැබිය යුතු සිනමා ශාලා ගාස්තු සහ ප්‍රචාරණ ගාස්තු පිළිවෙලින් රු.6,488,441 ක් සහ රු. 1,353,070ක් වර්ෂයක් තුළ අයකළ යුතුව පැවැතුණි.	-එම-	-එම-

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	2022 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සභාවට ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 1,188 කින් 868 ක් පමණක් සභාව විසින් අනුමත කර තිබුණි. ඉතිරි අයදුම්පත් 320ක් නැවත ඉදිරිපත් නොකිරීම, ඉඩම් ගැටළු, ලේඛන අඩුපාඩු සහ නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රමාදයන් වැනි හේතු නිසා අනුමත කර නොතිබුණි.	අඩුපාඩු නිවැරදි කිරීමට පියවර ගනිමින් සිටින බව.	ඉතා ඉක්මනින් ගැටළු නිරාකරණය කර බලපත්‍ර නිකුත් කිරීමට පියවර ගත යුතුය.
(ආ)	1915 අංක 15 දරන නිවාස ඉදිකිරීම් හා නාගරික සංවර්ධන ආඥා පනතේ 15(1) වගන්තිය ප්‍රකාරව; පනතේ විධිවිධානවලට අනුකූලව ගොඩනැගිලි ඉදිකර තිබේද යන්න තහවුරු කර අනුකූලතා සහතිකය (COC) නිකුත් කළයුතු වුවත්, 2022 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගොඩනැගිලි ඉදිකිරීමට ලබාදුන් සංවර්ධන බලපත්‍ර 868කින් බලපත්‍ර 89ක් සඳහා පමණක් අනුකූලතා සහතික ලබාදී තිබුණි.	අනුකූලතා සහතික ලබාගැනීම සඳහා දැනුම් දීම් අදාල පාර්ශවවලට සිදුකර නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව.	අනුකූලතා සහතිකය ලබාදීමට පියවර ගතයුතුය.
(ඇ)	2009 නොවැම්බර් 26 දිනැති අංක 1629/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව, මහා නගර සභා බල ප්‍රදේශය තුළ මස් පිණිස ඝාතනය කරනු ලබන ගවයින්ගේ බලපත්‍රය තහවුරු කරන සත්ව ලදුපත්/බලපත්‍ර ලබා නොගෙන, ආහාර පිණිස ගවයින් 4,821 දෙනෙකු ඝාතනය කර තිබුණි.	තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී.	ගැසට් නිවේදනයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ, ගොවිපලෙහි ඝාතකාගාරයේ ඝාතකාගාර ගාස්තුව සහ ඝාතකාගාර බලපත්‍ර ගාස්තුව අය නොකර ගවයින් 1,457 ක් ඝාතනය කර තිබූ අතර, එමගින් මහා නගර සභාවට රු. 1,048,312 ක ආදායමක් අහිමි වී තිබුණි.	සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාගේ අවධානයට යොමු කරනු ලබන බව.	ඝාතකාගාර ගාස්තුව සහ ඝාතකාගාර බලපත්‍ර ගාස්තුව අයකර ගැනීමට පියවර ගත යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ මහා නගර සභාවේ අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා තිබූ රු. මිලියන 331ක් වටිනා මූලධන ව්‍යාපෘති 12ක් වර්ෂය අවසාන වන විටත් ආරම්භ කිරීමට පියවර ගෙන නොතිබුණි.	මූලික ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	ව්‍යාපෘති නියමිත කාලවකවානු තුළ ආරම්භ කිරීමට පියවර ගත යුතුය.
(ආ)	කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී තිබුණු වර්ෂ 10ත් වර්ෂ 30ත් අතර කාලයක් පැරණි රු. 6,883,066 ක අත්තිකාරම් 28ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කරගෙන නොතිබුණි.	ඉදිරි වැඩපිළිවෙලවල් ගනු ලබන බව.	අත්තිකාරම් නිරවුල් කිරීමට නොපමාව කටයුතු කළ යුතුය.
(ඇ)	2016 සිට 2024 දක්වා, පරිත්‍යාග සහ ප්‍රාදේශීය සංවර්ධන සහාය ව්‍යාපෘතිය මගින් පුස්තකාල සහ සංවර්ධන කටයුතු සඳහා ලබා දුන් රු. 1,876,752 ක් අදාල අරමුණු සඳහා උපයෝජනය නොකර මහා නගර සභාවේ පොදු තැන්පතු ගිණුමේ රඳවා තබා තිබුණි.	ආදායම් ගිණුමට මාරුකිරීමට පියවර ගෙන ඇති බව.	අරමුදල් උචිත අරමුණු සඳහා භාවිතා කිරීමට පියවර ගත යුතුය.
(ඈ)	කල් ඉකුත් වූ රු. 1,000,000 ක් වටිනා කාර්යසාධන බැඳුම්කරය වර්ෂ 02 කට අධික කාලයක් ආදායම් ගිණුමට මාරු කිරීමට පියවර ගෙන නොතිබුණි.	ආදායම් ගිණුමට මාරුකිරීමට පියවර ගෙන ඇති බව.	ආදායම් ගිණුමට මාරුකිරීමට පියවර ගත යුතුය.

3.3 මෙහෙයුම් අකායර්ක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ මස්කඩ 05ක් සහ සුපිරි වෙළෙඳ සැල් 04ක් ආදිය බදුකුලියට ලබා නොදීම හේතුවෙන් රු. 5,750,016 ක ආදායමක් අහිමි වී තිබුණි.	ලංසු කැඳවා තිබූ නමුත් කුලියට ලබා ගැනීමට කිසිදු අයෙකු ඉදිරිපත් නොවූ බව.	ආදායම් මූලාශ්‍ර ප්‍රශස්ථ ලෙස පවත්වාගෙන යාමට පියවර ගතයුතුය.
(ආ)	මහා නගර සභාවේ ගිනි නිවන රථයක් අනතුරට ලක්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලැබිය යුතු රු. 4,194,000 ක වන්දි මුදල වර්ෂ 04 කට අධික කාලයක සිට අයකර ගැනීමකින් තොරව පැවැතුණි.	ඉදිරි වැඩපිළිවෙලවල් ගනු ලබන බව.	වන්දි මුදල කඩිනමින් අයකර ගැනීමට පියවර ගත යුතුය.

(ඈ)	කඩකාමර 196ක කුලී ගිවිසුම් වර්ෂ 03 සිට 35කට අධික කාලයක් අළුත් නොකර කුලී අයකරමින් පැවැතුණි.	ගිවිසුම් අළුත්කිරීමට කටයුතු කරමින් පවතින බව.	ගිවිසුම් අළුත්කිරීමට කටයුතු කළ යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගුරුනගර් වෙළෙඳ පොල සංකීර්ණයේ පිහිටි කඩකාමර 41ක් සහ වාහන 44ක් අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට වර්ෂ 01ත් වර්ෂ 10ත් අතර කාලයක සිට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අළුත්වැඩියා කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	වත්කම් භාවිතා කිරීමට හැකිවන පරිදි අලුත්වැඩියා කිරීමේ කටයුතු කඩිනම් කළ යුතුය.
(ආ)	සභාව පරිහරණය කරනු ලබන ඉඩම් 22ක් සහ පරිත්‍යාග ලෙස ලැබී තිබූ වාහන 26ක අයිතිය සභාවට පවරා ගෙන නොතිබුණි.	සභාවට පවරා ගැනීමට පියවර ගෙන ඇති බව.	වත්කම්වල අයිතිය සභාවට පවරා ගැනීමේ කටයුතු කඩිනමින් කළ යුතුය.

3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.3 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව, රු.500,000ක් ඉක්මවන කුමන වර්ගයේ භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා විධිමත් ගිවිසුමකට එළැඹිය යුතු වුවත්, මහා නගර සභාව විසින් එකතුව රු.5,770,200 ක ප්‍රසම්පාදනයන් 02ක් සම්බන්ධයෙන් සැපයුම්කරු සමග එවැනි විධිමත් ගිවිසුමකට එළැඹ නොතිබුණි.	ඉදිරි කාලයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිවැරදිව අනුගමනය කරනු ලබන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව විධිමත් ගිවිසුමකට එළැඹිය යුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට තනතුරු පුරප්පාඩු 148ක් පැවැතුණි.	කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	අතිරික්තව පවතින සංවර්ධන නිලධාරීන් 26ක් සඳහා අනුමැතිය ලබාගැනීමට විගණිත දින වන විටත් පියවර ගෙන නොතිබුණි.	කාර්ය මණ්ඩල පිළිබඳ අදාල දෙපාර්තමේන්තුවට යවා ඇති බව.	අතිරික්ත කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබාගැනීමට පියවර ගත යුතුය.

(ඇ)	මහා නගර සභාවේ වාහන අංශයේ රියැදුරු සහ වැඩබලන රියැදුරන් ඇතුළුව 40ක් සේවය කරන අතර මෙයට අතිරේකව බාහිර පදනමින් රියදුරන් 10 දෙනෙකු පත් කිරීම හේතුවෙන්, දෛනික වැඩ කාලසටහන් ඇස්තමේන්තුව අනුව, සමාලෝචිත වර්ෂය තුළ රියදුරන් 32 දෙනෙකු දින 847ක් රාජකාරියේ නොයොදවා කාර්යාලයේ රඳවා තිබුණි.	අවශ්‍යතාවය මත රියැදුරන් කාර්යාලයේ රඳවා තිබුණු බව.	කාර්යමණ්ඩල අවශ්‍යතාවය පිළිබඳව සමාලෝචනයක් කර අනුමත කාර්යමණ්ඩලය විධිමත් කර ගත යුතුය.

4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

4.1 වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මහා නගර සභාව විසින් සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම, 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ උපදෙස් පරිදි, සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික අයවැය පදනම් කරමින් ප්‍රමුඛතාව අනුව සැලැසුම් ක්‍රියාත්මක කරන කාලසටහන සහ එහි ක්‍රියාකාරකම් වලින් අපේක්ෂිත නිමැවුම් /ප්‍රතිඵල නිශ්චිතව දක්වමින් ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි.	ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට ක්‍රියාමාර්ග ගනු ලබන බව.	චක්‍රලේඛය ප්‍රකාරව, ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය.

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය සඳහා සඳහා සකස් කර තිබූ අයවැය ප්‍රකාරව ඇස්තෙමින්තු ගත ආදායම් සහ වියදම් හා තථ්‍ය ආදායම් සහ වියදම් සමග සැසඳීමේදි ආදායම් විෂයන් 05ක සියයට 14 සිට සියයට 38ක් දක්වාත්, වැය විෂයන් 06ක සියයට 23ක සිට සියයට 75ක් දක්වාත් එක් මූලධන වැය විෂයක සියයට 66ක විචලනයක්ද පැවැතීම හේතුවෙන් අයවැය, ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි.	ඉදිරියේදී අයවැය පාලනය අනුගමනය කිරීමට පියවර ගනු ලබන බව.	අවශ්‍යතා හඳුනාගෙන සැලැකිලිමත් ලෙස අයවැය සකස් කර ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.

4.3 පාරිසරික ගැටළු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගත් කල්ලුන්ඩායි ප්‍රදේශයේ මදුරුවන් බෝවීම මර්දනයට මැසි තෙල් ඉසීම හා දුර්ගන්ධය නැති කිරීමට සුදුසු ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි.	අඩුපාඩු නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	මදුරුවන් බෝවීම මර්දනයට සහ දුර්ගන්ධය නැති කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	නිෂ්පාදනයන් සිදුකළ නොහැකි නොදිරන අපද්‍රව්‍ය විවෘත ස්ථානයක බැහැර කළ නොහැකිව පැවැති අතර, හැකි පමණ ප්‍රතිචක්‍රීකරණය කළහැකි ද්‍රව්‍ය වෙන්කර ප්‍රතිචක්‍රීකරණය සඳහා යැවීමට කටයුතු නොකර පරිසර හානි සිදුවන අයුරින් ගිනි තැබීම් කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් එහි අතිවිශාල ගින්නක් හටගෙන 08වතාවක් පාලනය කිරීමට සිදුවී තිබුණි.	පිළිතුරු ලබාදී නොමැත.	අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට භාජනය කිරීමට හෝ විකල්ප ක්‍රියාකාරකම්වල යෙදවීමට පියවර ගත යුතුය.
(ඇ)	1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර හා ඒ යටතේ බලාත්මක වන රෙගුලාසිවලට අනුකූලව ලී මෝල් 26ක්, වී මෝල් 19ක් සහ බේකරි 17ක්, වාහන පිරිසිදු කිරීමේ මධ්‍යස්ථාන 02ක්, විදුලි අළුත්වැඩියා කිරීමේ වැඩපල් 51ක් සහ ඒම්බාම් කිරීමේ ස්ථාන 06ක් ආදියෙහි කල් ඉකුත් වූ පරිසර බලපත්‍ර අළුත්කිරිමට පියවර ගෙන නොතිබුණි.	පරිසර ආරක්ෂණ බලපත්‍ර අළුත් කිරීමේ කටයුතු සිදුකරනු ලබන බව.	ජාතික පරිසර හා ඒ යටතේ බලාත්මක වන රෙගුලාසිවලට අනුකූලව පරිසර බලපත්‍ර අළුත් කරලීමට පියවර ගෙන ඒ අනුව වෙළඳ බලපත්‍ර නිකුත් කළ යුතුය.